


වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපති

ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා

විසිනි.




"සුළු පිනක් කිරීමට මැලි නොවිය යුතුය"

( ධම්ම පදය කෝධ වගගය ඇසුරෙනි )




*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!*

*සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය - දජ්ජාප්පස්මිම්පි යාචිතො*
*එතෙහි තීහි ඨානෙහි - ගච්ඡෙ දේවාන සන්තිකෙ*




සද්ධර්මකාමී පින්වතුනි,

අද බිනර පුර පසළොස්වක පොහොය දිනයයි. ඉහත සඳහන් වන්නේ සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායෙහි ධම්මපද පාලියෙහි කෝධ වග්ගයෙහි සතරවෙනි ගාථා ධර්මයයි.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවන අරමෙහි වැඩ සිටිති. මුගලන් මහ රහතන් වහන්සේ වරින් වර දෙව් ලොවට වැඩම කරති. එහි සැරි සරති. එක්තරා දිව්‍ය විමානයක් අසලින් වැඩම කරද්දී එක් දෙව් දුවක් වැන්දේය . දේවතාවියගේ ස්වභාවය දුටු රහතන් වහන්සේ

“ දේවතා දුවනියනි ඉ මේතරම් දිව්‍ය සම්පත්තියක් ලැබීමට ඔබ කළ පින කුමක්ද?” දෙව් දුව නිහඬව ලජ්ජාවෙන් මිරිකේ නැවතත් මහ රහතන් වහන්සේ “ලජ්ජාවීමට හේතුවක් නැත කළ පින්කම කුමක්දැයි ” විමසූහ. එවිට දේවතා දුවනිය කියන්නේ හිමිතුමනි , මම මිනිස් ලොවදී ඉතා දුප්පත්ව ජීවත් වූ කෙනෙකි. එසේ වුවද පව් කිරීමට ඇති බිය තිබුනි. බොරුවක් කිසි දවසක නොකීවෙමි. සත්‍යම කථා කළෙමි. ඒ නිසා මේ දිව්‍ය සැප ලද්දෙමි.

ඒ පරිදි තව තවත් දේවතාවියන්ගෙන් මේ විදියට රහතන් වහන්සේ විමසූ සේක. ඒ දෙව් දුවනියන් කියන්නේ ද " මම මිනිස් ලොව ඉතා අසරණ මෙහෙකාර කෙල්ලක්මි, කෝපය මැඩගෙන ඉවසීමෙන් ජීවත් වුනෙමි , එබැවින් මේ දිව්‍ය සම්පත් ලදුයෙමි, මම උක් හේනක් බලා සිටිද්දී උක් දඬුවක් පූජා කිරීමෙන්ද, මම තියඹරා ගෙඩියක් පිදීමෙන්ද, මම කැකිරි ගෙඩියක් පිදීමෙන්ද, මේ සම්පත් ලැබුවෙමියි. වෙනත් දෙව් දුවරු කීහ. මේ හැම දෙව්දුවක්ම ඉතා සුලු පිනක්ම කළ බව ඔවුන් කිහ. මුගලන් හිමියන් මේ සිද්ධිය ජේතවනයේ වැඩ සිටින බුදු හිමියන්ට පැවසූහ. ඒ නිමිතිකොට සත්‍යකීම, නොකිපීම, මඳක් හෝ දීම දෙව් සැපට හේතුවන බව තහවුරු කොට වදාළහ.

දැනට මේ අප ගතකරන්නේ මෙම වර්ෂයේ වස්සාන සමයයි. අපේ රටේද බෞද්ධ ජනතාව තම තමන්ගේ විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලාට වස් කාලය වාසය කිරීමට ආරාධනා කොට වෙනදාට වඩා පින් දහම් කිරීමේ ප්‍රවනතාවයක් ඇතිවයි කාලය ගත කරනුයේ . ඒ නිසා අප ගිහි පැවිදි දෙපාර්ශ්වයම පින් රැස් කර ගන්නා විශේෂ කාලයක් බැවින් ඉහත සඳහන් මාතෘකාව බොහෝ වැදගත් වනු ඇතැයි විශ්වාස කරමි.

ගාථාවෙහි සඳහන් වන දේවතාවියන්ගේ ප්‍රකාශයන්ගෙන් සඳහන් වන්නේ සත්‍ය කථා කිරීම, නොකිපීම, සුළු වෙන් හෝ දීම දිව්‍ය සම්පත් ලැබීමටද හේතුවන බවයි.

" සච්චං භණෙ න කුජ්ජෙඣයප්" සත්‍යම කථා කළ යුතුයි . වරදෙහි අනුන් කෙරේ නොකිපිය යුතුයි. " දජ්ජාප්පස්මිම්පි යා චිතො" යම් කිසිවෙක් යමෙක් ඉල්ලයිද ඉල්වන දෙයින් ටිකක් හො'දිය යුතුයි.

අපේ ශරීරයේ අවයව අතරින් ඉතා උතුම්කොට සළකන්නේ දිව හා කටයි. දිවෙන් යම්කිසිදෙයක් ලුනු, ඇඹුල්, පැණි, තිත්ත, කහට ආදී මිහිරි හෝ අමිහිරි රසයන් හඳුනා ගනී . දිවට දැනෙන ඒ හැම රසයකට වඩා ඉතා උතුම් වූ රසය

සත්‍ය රසයයි. ඇත්ත කීමයි එබැවින් බුදුරජාණන් වහන්සේ ආලවක සූත්‍රයේදී "සච්චං හවේ සාධු තරං රසානං" සත්‍ය වචනයේ රසය අතිශය මනෝඥවේය යනුවෙන් වදාලහ. හින්දු දහමේ ශිව දෙවියන් මහා දෙවි කෙනෙකි හින්දූන් ඉතා ගරු කරති. " සත්‍යම් ශිවම් සුන්දරම්" සත්‍ය ශිව දෙවියන්ටත් වඩා සුන්දරයයි දක්වනුයේ ඔවුන්ගේ විශ්වාසයට අනුව ශිව දෙවියන්ගේ තේජස සහ ගෞරවයද නොතකාය. මවන දෙවිකෙනෙකුට වඩා වචන ගුණ ධර්මය උසස් බව නොකියා කියති.

බෞද්ධයින් වශයෙන් බොරු නොකියා සත්‍ය කථා කළ යුත්තේ දිව්‍ය ලෝකයේ උපදින්නටම නොව බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළ ධර්මය ලෝකයේ යථාර්ථය හෙවත් ඇති තතු හෙවත් ආර්‍යය  සත්‍යයයි. එම සත්‍ය දැකීමට අපිදු උත්සාහගන්නා පිරිසකි. එබැවින් අප බෞද්ධයෝය ඇතමුන් කියන්නේ මේ කාලයේ බොරු නොකියා ජීවත් වන්නට බැරිය කියාය. ඒ ඔවුන්ගේ අසත් ධර්මයයි පෞද්ගලික මතයයි. සත්‍ය යනු බුදුවරුන්ගේ සත්ධර්මයයි. ඒ නිසා සත්‍ය පුරුද්දක්  පාරමිතාවක් බවට පත් කර ගත යුතුය.

දිනක් භාග්‍යවතුන් වහන්සේ රාහුල පුංචි හාමුදුරුවන් වහන්සේ අමතා හිස් දිය බඳුනක් පෙන්වා රාහලය, මෙහි කිසිවක් ඇත්දැයි ඇසූ සේක. කිසිවක් නැතැයි රාහුල හිමිගේ පිළිතුර විය. ඉන් පසු භාග්‍යවතුන් වහන්සේ රාහුලය දැන දැන බොරු කීමද ලජ්ජා නැත්තාගේ ජීවිතය ද මේ හිස් දිය බඳුන මෙන් හිස් එකක් යයි වදාළහ. බොරු කියන්නාට ගුණ ධර්මයක්ද නොපිහිටන බව වදාළහ. එයින් හැඟෙනුයේ නිර්වාණ ධර්මයට පත්වීම තව ඈතට යන බවයි. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ ද දුකින් මිදී ලෝක සත්වයාද දුකින් මුදවා ගැනීමට අනන්ත කාලයක් සත්‍ය, පාරමිතාවක් ලෙස පුරා ආත්මභාව සියදහස් ගනන් ඇස්, ඉස්, මස් ලේ අඹු දරුවන් හා සිය ජීවිතයද පරිත්‍යාග කොට අන්තිම ආත්මභාවයේදී "කිං සච්චගවේසී" සත්‍ය කුමක්දැයි සොයන්නෙක්ව මැදුම් පිළිවෙත් හි පිහිටා පරම සත්‍ය අවබෝධ කොට වදාළේ සත්‍ය වචනයේ බලයෙනි.

බොරු නොකියා සත්‍ය වචන කථා කිරීම මරණින් මතු දිව්‍ය ලෝකයේ ඉපදීමට හේතුවනවා මෙන්ම බොරු කියන පුද්ගලයා මරණින් මතු අපගාමී නිරයෙන් චුතව මිනිසත් බව ලැබුවොත් නොයෙක් බොරු චෝදනාවන්ට ලක්වීමටද , දීනයෙකු වීමද, මෝඩයෙකු වීමද, ගොතවීමද, අප්‍රිය පෙනුමකින් යුතුවද, මත්සයෙකුගේ සේ දිව පිහිටීමද, සර්පයින්සේ කබරුන්ගේ සේ දිව දෙකක් වී පිහිටීමද පිරිමි දරුවන් නොලැබීමද ගැහැණු දරුවන්ම ලැබීමද (දෙපාර්ශවයේම දරුවන් ලැබීම විය යුතුය) යනාදී අනිටු විපාක ලබන්නේය.

සත්‍ය නොකියා බොරු කියන්නා ශිෂ්ඨ සමාජය පිළිකුල් කරයි. ඔහු ඇත්තක් කීවත් සමාජය පිළිනොගනී. බොරු කාරයාට වග කිවයුතු කිසිවක් භාර නොදීම මානව සංහතියේ සවභාවයයි. වර්තමාන ලෝකයේ දේශපාලනයට ඉදිරිපත් වන්නන්, සමාජ නායකයින්, ආගමික නායකයින්, පරලොව කෙසේ වෙතත් මෙලොව තමනුත් සමාජයත් නොපිරිහීමට බොරු නොකියා ඇත්ත කිව යුතුයි . කට තිබූ පලියට වැඩිපුර කථාකිරීමෙන් බොරු කියන්නට වේ. උසස් ගති ඇත්තා වැඩිපුර කථා නොකරති. අවශ්‍ය දේ කියා නිහඬ වෙති. සමාජය ජයගන්නට නම් සත්‍ය කථා කළ යුතුය. අද අප සමාජයේ බොරු කියන අයට චේතිය රජ පරම්පරාවේයැයි ව්‍යවහාර කරන්නේද චේතිය රජතුමා බොරු කියා පොළව පැළී එහි ගිලී මරණය වී අපාගාමී වූ නිසාය. යුධ ගිනි ඇවිලීමට රටක් ජාතියක් විනාශ කිරීමටද බොරුවට හැකිය. සත්‍යයෙන් තොර බොරු කීම අද විලාසිතාවක්ව ඇත්තේ අලංකාර වේදිකා හදාගෙන බොරු කියා සමාජය රවටන පිළිවෙත නිසාය.

මාතෲකා ගාථාවෙහි දැක්වෙන පරිදි අනෙක් දේවතාවිය කියන්නේ පෙර මිනිස් ලොව සිටියදී ඉතා අසරණ මෙහෙකාරියකි. එහිදී ස්වාමි පක්ෂයෙන් ලැබෙන ගැහැට ඉවසාගෙන කෝපය යටපත් කරගෙන ජීවත් වීමෙන් මෙම අප්‍රමාණ දිව්‍ය සම්පත් ලැබුණ බවයි.

මේ ගාථාවෙහි "න කුජේඣයය" යනුවෙන් දක්වා ඇත්තේ නොකිපීමයි. දණ්ඩෙන් පහර ලත් සර්පයෙකු මෙන් අප කුපිත කිරීමේ ශක්තියක් ද්වේශය නැමැති සතුරාට ඇත. මේ සතුරාගේ වසඟයට ගිය ලෝකයාට එතෙක් කළ ගුණයන්ද සියල්ල අමතක කිරීමට ශක්තිය කෝපවීම තුළ ඇත. අපේ සිත් වනසා දමා අපගේ සිත දුකට ඇද දමයි . කෙසේද යත් පොතුහර (තවසාර) ගසේ පොත්ත අරටුව කොට ගත් උණ බට ආදී ගස මෙන් පළ දැරීමෙන් ගසේ විනාශය වන්නා මෙන් , බතක් පිළුනු වන්නාක් මෙන් , සිත් සතන් දූෂණයට පමුණු වන්නා වූ තත්වයයි. ව්‍යාපාදය යනුවෙන් මෙය හඳුන්වයි. ක්‍රෝධය මුල්වී ව්‍යාපාදය හට ගන්නා බැවින් මානසික රෝග අතරින් ක්‍රෝධය ඉතා භයානක වහා ඇවිලෙන ගින්නක් මෙන් යුහුසුළුව අනතුරු සලසයි.

අද වත්මන් සමාජයේ සිදුවන මිනී මැරුම් දහස් ගණන් අඬ දබර ඇතිවන්නේ ක්‍රෝධයාගේ දරුණු කම නිසාය . මෙකල ක්‍රෝධය පමණක් නොව හැම අපරාධයක්ම සිදුවන අවස්ථා සහ සිදුවන විධි රූපවාහිනිය මගින් දැක ගත හැකි වාර අනන්තය. එදා ජනයාට ඇහින් දැකීමේ මාධ්‍ය නොතිබුනද ගුණ දම් වහා හඳුනාගත් නමුදු අද ඇහින් දැක දැකත් මේ වාගේ බරපතල කම හඳුනා ගැනීම ප්‍රමාද වන්නේ අධර්මය ඉක්මනින් පැතිරවීමේ බලය නිසාය. කිපෙන තැනැත්තා අනයයාහට ගැසීමට රත් වූ යකඩ ගුලියක් අතින් ගත් කෙනෙකු මෙනි. එයින් තමාගේ ශරීරයද පිළිස්සෙන බැවිනි .තම ගුණය නසා ගනී. සිත කිලිටි වූ ඔහුට නොකළ හැකි අපරාධයක් ලෝකයේ නැත . මෙම ක්‍රෝධය නැමැති කිපීම නැමැති ගුණය යමෙක්ගේ සිත තුළ පැවැතී පරලොවද නිරය දුකට භාජනය වේ. බුද්ධ ධර්මයේ සඳහන් වන පරිදි අටමහ නරකයන්ගෙන් සඤ්ජීව නම් නරකයේ මෙවැන්නවුන් උපදී, එහිදී යම පලුන් විසින් එහි උපන් සත්වයන් ගිනියම් වූ පොළොවෙහි පෙරලා කෑලි කපද්දීත් ඒ සත්වයන්ට නැවත නැවත ජීවය ඇතිවේ. එම ලැබෙන ජීවයම දුකට හේතුවේ. එබැවින් ඒ නරකය" සඤ්ජීව" නම් වෙති. මේ නරකයෙහි ක්‍රෝධ කළ අයද, මානයෙන් අනුන් හා කළහ කළෝ ද, දුබලයන් පෙළූ රජවරු නිළධාරීන්, දිළින්දන් පෙළූ පොහොසතුන් හා මැරයෝද, සතුන් මරන්නෝද, උපදින බව දැක්වේ.

ක්‍රෝධ කළවුන් ඉහත කී නරකාදි දුකින් මිදී යම් කළෙක මිනිස් ලොවට ආ කළ රෝග පීඩා ඇති කරයි. අප්‍රසන්න පෙනුම, ලේ දෝෂ, පිළිකා (ලියුකේමියා) වැනි තත්වයන්ද ඇතිවේ. එවැනි තත්වයන් ඇතිවන්නේ ක්‍රෝධ කිරීමේදී ගුණදම් බලය බිඳීමෙන් මෙන්ම කායිකව ලේ දූෂිතභාවයයි. ඉක්මනින් කිපෙන ආයතන ප්‍රධානින්ට පාලකයින්ට වන්නේ මේ තත්වයයි. බොහෝ දුරට මේවා තේරුම්ගෙන කටයුතු කරන්නේ නම් මෙයින් මිදිය හැකිවේ.

දීඝ භාණක අභය නම් වූ මහතෙරුන් වහන්සේ අරියවංශ දේශණාව දේශණා කරද්දී බොහෝ සැදැහැවතුන් පැමිණීමද සත්කාර කිරීමද සිදුවිය . මෙය ඉවසා ගත නොහී එක් මහළු තෙරනමක් "දීඝභාණකයා අරියවංශය කියමි යි මුළු රෑ කල බල කළා" යයි ආක්‍රෝශ කළේය. බණ අවසන් වී දෙදෙනා වහන්සේ තම තමන්ගේ විහාර වලට යද්දී ගව්වක් පමණ එක මග ගියහ. මහළු තෙර ඒ ගව්ව පුරා අභය තෙරුන් වහන්සේට බැන්නේය. සියල්ල ඉවසමින් ගොස් දෙදෙනා වෙන්වන හන්දියේදී මහළු තෙරනුන්ට වැඳ මෙතනින් ඔබ වහන්සේ වඩින මග යයි කීහ. ඒ මහළු තෙර නොඇසුනා සේ කිපී කිපී ගියේය. අභය තෙරුන් වහන්සේ සමග ගිය අතවැසි භික්ෂුව "ස්වාමීනි ගව්වක් පමණ අපහාස කළ ඒ නමට කිසිවක් නොකිවේ ඇයි?" දැයි ඇසීය . අභය හිමියන් පිළිතුරු දෙමින් "ඉවසීම මට භාරය, ඉවසීමෙන් තොරව එක් පියවරක්වත් නොඑසවීමි" යි කීය. මේ කතා ප්‍රවෘත්තියෙන් කියවෙන්නේද ලොව විසූ උතුමන් ක්‍රෝධයට වසඟ නොවී ඉවසූ ආකාරයයි. ඉහත කී දෙවගනද දුප්පත් මනුෂ්‍යයෙකුව සිටියදී ඉවසීමේ විපාක වශයෙන් දිව්‍ය සම්පත් ලද බව දැක්වේ.

තුන්වෙනි කාරණය වශයෙන් "දජ්ජා පප සම්මිපි යාචිතො" අනුන් විසින් ඉල්ලූ කළ ටිකක් හෝ දිය යුතු බවයි. යාචකයා යනු ඉල්ලන්නාය. ඔවුන් අතුරෙන් දෙව් මිනිසුන්ගේ වැඳීම් පිදීම් වලට භාජනය වූවෝ සීලවන්ත ගුණවන්ත උතුමෝය. පැවිදි ජීවිතයෝය . " අපිට මේ මේ දෙන්නට" යයි. නොඉල්වති . යමක් අවශ්‍යනම් ගේ දොරට පැමිණ මුවින් නොඉල්ලා වැඩ සිටීම ආර්ය උතුමන්ගේ ඉල්ලීමයි.

එම සිල්වතුන් විසින් නිහඬව ඉල්ලද්දී තමා සතු දෙය සුළු වුවද සිල්වතුන්ටද අනෙක් ඉල්ලන යාචකයින්ටද මසුරු මල මැඬදීම දෙව් ලෝ සැප ලැබෙන හේතුවක් බව වදාළහ.

දානය පූජා වශයෙන් හෝ අනුග්‍රහ වශයෙන් ආකාර දෙකකි. දීමය, දානය යන දෙකටම දානය යන වචනය ව්‍යවහාර වේ. මෙහිදී පළමුවෙන් තේරුම්ගත යුත්තේ දෙන වස්තුවට දානයයි ව්‍යහාර නොවේ . දීමේ ක්‍රියාව දානයයි. මෙහිදී මාතෘකා ගාථාවේ සුළුවෙන් හෝ දීම දෙව් සැප දෙන කාරණයක් බව පැහැදිලි වේ. දස පුණ්‍යක්‍රියා ආදී සෑම කාරණයකදීම දානය මුල් තැනට ගැනේ. බෞද්ධයාගේ පරමාර්ථය නිවනයි. නිවනට පත්වීම යනු සිත තුළ පවත්නා තෘෂ්ණාව සහ මුලින් දුරු කිරීමයි. ඒ සඳහා අත්හැරීම පුරුද්දක්කර ගත යුතුය. අත් හැරීම පුරුදුකිරීමට ටිකක් හෝ දී පුරුදු විය යුතුයි. දෙන ලද ප්‍රමාණය එහි වටිනාකම මත දීමේ ආනිසංශය තීරණය කරන්නේ නැත. දෙන්නාගේ සහ ලබන්නාගේ ගුණ ධර්ම මත එය තීරණය වේ. එය ධර්මයට හා විනයට එකඟව සිදුවිය යුතුය. දානය යන වචනය අද ඇතැම් බෞද්ධයින් තේරුම් ගත් ආකාරයේ වරදක් පෙනේ . බියවිය යුතු අපහසු දුෂ්කර කාර්යයක් බවට දීම සඳහා යොදා ගන්නා දාන වස්තු ගැනම සිතිම නිසා චේතනාව ගැන නොසිතීම නිසා දන් දිම මහත් අපහසු තත්වයට පත්ව ඇත. පුණ්ණාදාසිය පූජා කළේ කුඩු රොටියකි. එහි ආනිසංස බලවත් වූයේ චේතනාව මතය. මාතෘකා ගාථාවේ දේවතාවියන් මිනිස් ලොවදී ඉතා දුප්පත්ව අසරණව කියන්නට තරම් ලැජ්ජා ඇති සුළු වශයෙන් දෙන ලද දානයෝය. දන් දිමට පෙහොසත් කමට වඩා සිතෙහි බලවත් කම මූලික වන බව පැහැදිලි වේ . එවිට දානයක් දීම ගැන සිතන විටත් සැනසීමක් ඇති වේ . දන් දිම සඳහා යොදා ගන්නා දාන වස්තුවේ වටිනාකම ගැන සිතුවොත් ඉහත දේවත්වයට පත් වූ දිළිඳු අයට දන් දීමට වත් ආනිශංස ලැබිමටත් නොහැකි වනු ඇත. එවිට දන් දීමට මුදල් නැති ඇත්තන්ට දන් දීමෙහි උනන්දුවක් ඇති නොවේ. මුගලන් මහරහතන් වහන්සේ මේ බව හොඳින් අවබෝධ කරගෙන සසර කතරේ අසරණ වූ ලෝ සතුන්ට අනුකම්පාකොට දෙව් ලොව සිසාරා වැඩම කොට මෙවැනි සිද්ධින් සිව්වනක් පිරිස ඉදිරියේ භාගයවතුන් වහන්සේට ඉදිරිපත් කොට සම්මත කරගෙන එදා සහ හෙට අද ජීවත් වන අප සැමගේ සැනසීමට

ඉතිරිකොට ඇත. වත්මන් සමාජයේ ඇතැමුන් කාලීනව වෙනස්කම් කර ගත්තාට වරදක් නැතැයි කියා බුදු සසුන තුළ ඇතැම් තථාගත දේශනා වෙනස් කිරීමට යත්නදරන මෙකල මෙම වස් කාලයේ දී සත්‍ය කථා කරමින් නොකිපී සුළුවෙන් යමක් තමන් ලද පමණින් දෙමින් ධර්‍මයට සහ විනයට එකඟව කාලීන වෙනස්කම් කරගෙන එසේ ජීවත් වෙමින් සසර ගමන දෙව් මිනිස් සැප ලබමින් උතුම් ධර්‍මාවබෝධයට කල්නොයවා හේතු සාධනය කර ගැනිමට බිනර පොහෝ දිනදී අධිෂ්ඨාන කර ගනිමු.